# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/31 - 2023 ජූලි මස 19 වැනි බදාදා - **2023.07.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : DS/GFG/L&L/5/2013/01.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/4/2012/D/340.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 101සී දෙද්දුගොඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දෙද්දුගොඩ උතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 810022 දරන කැඩැස්තර පිඹුරේ, කලාප අංක 06 හි පත්‍ර අංක 03 හි කැබලි අංක 98 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.2072 ක් වූ පහත නම්වලින් හා මායිම්වලින් යුත් බිම් කොටස සඳහා මායිම් :

01. **කැබලි අංක 98**

ඉඩමේ නම: *උස්වත්ත හෙවත්* කුඩාහෙට්ටිගෙවත්ත සහ පණ්ඩිතගෙවත්ත, වරිපනම් අංකය 104; හිමිකම් කියන අය: සඳරූන් සෙන්ටර් ෆෝ ඩිසේබල්ඩ්; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ මිශ්‍ර භෝග වගාවක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2072 ක් පමණ වේ.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 සැප්තැම්බර් මස 11 වැනි දින පෙ.ව. 10.00 ට ගාල්ල කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2023 සැප්තැම්බර් මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. එස්. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
කඩවත්සතර - ගාල්ල.

2023 ජූලි මස 14 වැනි දින,
කඩවත්සතර - ගාල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0181


1A - G 039932 – 11 (2023/07)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*